**ජාතික තරුණ සේවා සභාව - 2018**

**---------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------------**

ජාතික තරුණ සේවා සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රමිතයෙහි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්තන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු ගොඩනැගිලි 477 ක්, ලී බඩු උපකරණ ඒකක 28,555 ක් හා යන්ත්‍රෝපකරණ ඒකක 1,797 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, එහි දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව වටිනාකම ශූන්‍ය වූ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට ඉදිරියේදී කටයුතු කර දළ ධාරන අගය ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 69 ඡේදයට අනුව වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවද, සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබූ පිරිවැය රු. 125,492,259 ක් වූ වත්කම් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්ෂය කර නොතිබුණි.<br>තවද, 2017 දෙසැම්බර් මාසයේදී ප්‍රත්‍යාගණනය කරන ලද මෝටර් වාහන 57 කට අදාලව සමාලෝචිත වර්ෂයට අදාල රු. 29,575,000 ක් වූ ක්ෂයවීම් ගිණුම්ගත කර නොතිබුණි. | 2019 වර්ෂයේදී සියළුම වත්කම් ප්‍රමිත පරිදි නිවැරදිව ක්ෂය කිරීමට කටයුතු කරන බවත්, ප්‍රත්‍යාගණනය කල වාහන සම්බන්ධ ක්ෂය ගැලපීම 2019 වර්ෂයේදී නිවැරදි කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 හි 11 ඡේදය පරිදි තොග වශයෙන් හඳුනාගත යුතු දෑ වලට අදාල කර ගත නොහැකි, සමාලෝචිත වර්ෂය තුළදී පශු නිෂ්පාදනවලින් රු. 4,644,701 ක ආදායමක් උපයන ලද සභාවේ ගොවිපලවල්වල ඇති කරනු ලබන එකතුව රු. 2,986,920 ක් වූ පශු සම්පත් අනුචිත ලෙස තොග වශයෙන් හඳුනාගෙන ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණය අනුව පෙන්වා දී ඇති පශු සම්පත් තොගය ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව වත්කම් හා තොගය වෙන වෙනම හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 හි 15 ඡේදයට අනුව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකමින් අඩු අගයට තොග අගය කළ යුතු වුවද එයට පටහැනිව තොග පිරිවැයට අගය කරන පරිදි තොග ප්‍රතිපත්තිය හඳුනාගෙන තිබුණි. | ඉදිරියේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 හි 15 ඡේදයට අනුව තොග අගය කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල විය යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්කන්ධය යටතේ රජයේ ප්‍රදාන හා විදේශ රාජ්‍ය වලින් ලැබී තිබූ ප්‍රදාන වශයෙන් රු. 5,298,332,712 ක ප්‍රාග්ධන ප්‍රදාන දක්වා තිබුණ ද ඒවා ක්‍රමානුකූල පදනමක් යටතේ ආදායම් ලෙස හඳුනාගැනීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි. | රජයේ ප්‍රදාන හා විදේශ රාජ්‍ය වලින් ලැබී තිබූ ප්‍රදාන වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇති වත්කම් භෞතික සමීක්ෂණ අනුව වත්කම් ඉවත් කිරීමේදී අදාල සමුච්චිත ක්ෂය වටිනාකම මෙම ස්කන්ධය යටතේ ගැලපීම් කිරීම ප්‍රතිපත්තියක් ලෙස පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. | රජයේ ප්‍රදාන ක්‍රමානුකූල පදනමක් යටතේ විලම්භිත ආදායම් ලෙස හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුහුණු මධ්‍යස්ථාන 11 ක් පවත්වාගෙන යාම සඳහා 1984 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලසීමාව තුළදී පවරාගෙන තිබූ ඉඩම් හා සභාවට නීත්‍යානුකූල අයිතිය තිබූ ඉඩම් 05 ක වටිනාකම හා සභාව සතු වාහන 06 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම් අංශයට වාර්තා කිරීම සඳහා ඉඩම් අංශය දැනුවත් කර ලිපි ඉදිරිපත් කර ඇති අතර වාහන සම්බන්ධයෙන් ඉදිරියේදී නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. | සභාවට නීත්‍යානුකූල අයිතිය ඇති හා සභාව විසින් භාවිතා කරනු ලබන වත්කම් වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2016 වර්ෂයේ සභා තීරණයක් මත ආපසු භාර නොගැනීමේ පදනම මත යොවුන් පාර්ලිමේන්තු මන්ත්‍රීන් වෙත බෙදාදුන් එකතුව රු. 14,016,500 ක් වූ මිනි ලැප්ටොප් 289 ක් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පරිගණක හා විද්‍යුත් උපකරණ වටිනාකම තුළ ඇතුළත් වී තිබුණි. එබැවින් වත්කම් එම වටිනාකමෙන්ද වාර්ෂික ක්ෂය හා ක්ෂය වෙන් කිරීමේ ගිණුමේ ශේෂය පිළිවෙලින් රු. 2,803,300 කින් හා රු. 8,409,900 කින් ද වැඩියෙන් දක්වා තිබුණි. | 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | සභාවේ වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) සභාව විසින් සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම වෙත කුලී පදනම මත ලබා දී තිබූ වාහන 02 ක් වෙනුවෙන් 2012 නොවැම්බර් 06 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා අයවීමට ඇති රු. 4,075,000 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි. | අදාල වාහන දෙක සඳහා අයවිය යුතු මුදල් ගෙවන ලෙස සමාගම වෙත ලිපි යොමු කර ඇතත් පිළිතුරු ලබාදීම හෝ මුදල් ගෙවීම සිදුකර නොමැත. | මුදල් අයකර ගැනීමට හෝ වාහන නැවත ලබා ගැනීමට හෝ කටයුතු කල යුතුය. |
| (ඇ) ඉකුත් වර්ෂයට අදාල රු. 32,065,606 ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාල රු. 13,988,144 ක උපචිත වියදම් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයට අදාලව ප්‍රතිපාදන වෙන් කර ඇතත් ලැබුණු මුදල් අනුව වියදම් කළ අතර අතැති බිල්පත්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ භාණ්ඩාගාර ලේකම්ගේ අංක BD/CPB/4/1/9/-2018 හා 2017.12.27 දිනැති චක්‍රලේඛ අංක 3/2017 හි 04 ඡේදය අනුව 2018 වර්ෂයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ගෙවීම් කටයුතු සිදුකර ඇත. එම නිසා 2017 වර්ෂයට අදාල වවුචර් වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණු අතර 2018 වර්ෂයට අදාල ගෙවීම් 2019 වර්ෂයේදී ගෙවා ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී උපචිත සංකල්පය අනුව වියදම් ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.5 ඒකාබද්ධ කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික තරුණ සේවා සභාවේ සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම 1981 වර්ෂයේදී ආරම්භ කර තිබුණද සභාවේ මූල්‍ය ප්‍රකාශන සමග සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | 2019 වර්ෂයේදී ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ මූල්‍ය තොරතුරු සමග සභාවේ මූල්‍ය තොරතුරු ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකරණය මගින් ලබාදී තිබූ නියෝග අනුව කටයුතු නොකිරීම හේතුවෙන් පුද්ගලයන් දෙදෙනෙකුගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එකතුව රු. 600,000 ක් අයකරගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | අදාල නිලධාරින්ගෙන් මාසිකව අයවීමට ඇති මුදල් අඛණ්ඩව අයනොවන බව නීති විමර්ශන අංශය දැනුවත් කර ඇත. | නීති අංශය මගින් ගෙන ඇති පියවරයන් සම්බන්ධ පසුවිපරම් කටයුතු සිදුකර අයකරගත යුතු මුදල් කඩිනමින් අයකරගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 109,356,000 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 292,520,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 183,164,000 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට තරුණ සංවර්ධන වියදම් රු. 143,492,000 කින් අඩුවීම හා අභ්‍යන්තර ඉපයීම් රු. 30,302,000 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 අනාර්ථික ගනුදෙනු

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 ජනවාරි 30 හා 31 යන දිනයන්හිදී ඇමරිකා එක්සත් ජනපදයේ පැවැත්වූ තරුණ සමුළුවකට සහභාගී වීම සඳහා සභා අධ්‍යක්ෂවරියක් සහ තරුණ නියෝජිතයින් දෙදෙනෙක් සඳහා ගුවන් ටිකට්පත් සහ අනියම් වියදම් වෙනුවෙන් එකතුව රු. 1,029,518 ක් වැය දරා තිබුණි. එහෙත් නියමිත කාලය තුලදී වීසා අනුමත කර ගැනීමට නොහැකිවීම නිසා අදාල සමුළුව නිමවන දිනයේදී දිවයිනෙන් පිටත්වීම හේතුවෙන් දරන ලද වියදම අනාර්ථික ගනුදෙනුවක් බවට පත්වී තිබුණි. | 2018.01.30 දින වීසා ලැබී තිබුණු අතර වැඩසටහන 2018.01.30 දින ආරම්භ වී 31 දින අවසන් වුවද එහි පසුවිපරම් කටයුතු 2018.02.01 දිනත් පවතින බව දැන සිටි නිසාත් ඇමරිකාවෙන් කරන ලද විශේෂ ආරාධනයට අනුව ශ්‍රී ලංකාවේ තරුණ කටයුතු සිදුකරන ආයතනයක් ලෙස ජාතික තරුණ සේවා සභාව නියෝජනය කරමින් කිසිවෙකු සහභාගී නොවුන හොත් ඉදිරියේදී ශ්‍රී ලාංකික තරුණයින්ට මෙවන් අවස්ථාවන් නොලැබෙන නිසාත්, ප්‍රමාද වී හෝ මෙම තිදෙනා අදාල වැඩසටහන සඳහා පිටත්කර යවා තිබුණි. | සමුළු ආරම්භ වන දිනයේදීම සහභාගී වීමට අවශ්‍ය කරන විධිවිධාන හා පහසුකම් සැලැස්විය යුතු අතර රජයේ මුදල් අරපිරිමැසුම්දායකව භාවිතා කිරීම ගැන විශේෂ අවධානය යොමු කළ යුතුය. |
| (ආ) ජාත්‍යන්තර තරුණ හුවමාරු වැඩසටහන් සඳහා නව රටවල් සම්බන්ධ කර ගැනීමේ ක්‍රියාවලිය යටතේ චීනයේ තරුණ සංවිධානයක් සමග එක්දින සාකච්ඡාවක් සඳහා 2018 ජූලි 09 දින සිට 2018 ජූලි 14 දින දක්වා දින 05 ක් සභාවේ නිලධාරීන් තිදෙනෙකු රු. 1,738,966 ක් වැය කරමින් චීනයේ සංචාරය කර තිබුණද 2019 ජූලි 30 දින වන විටත් අදාල සාකච්ඡාවල ප්‍රතිඵල වශයෙන් සභාවට ප්‍රතිලාභයක් ලබාදීමට අපොහොසත් වී තිබුණි. | සාකච්ඡාවලදී ඉදිරිපත් වූ අදහස් හා යෝජනා තුළින් නිරීක්ෂණය කළ යුතු ස්ථාන හඳුනාගන්නා ලද අතර ආයතන අතර පැවැත්වෙන තරුණ වැඩසටහන් හා සම්බන්ධවීමට අදාල වන හෙයින්ද සංචාරයෙන් පසු එම ආයතන සමග කටයුතු කිරීමේදී වැය දරන ආකාරය සම්බන්ධයෙන් අත්සන් කරන ලද ගිවිසුමක්ද ඇත. | එම සාකච්ඡා මඟින් සභාවේ කාර්යසාධනය වර්ධනය කර ගැනීමට කටයුතු කල යුතු අතර රජයේ අරමුදල් ඵලදායී කාර්යයන් වෙනුවෙන් වැය කල යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේ ජාත්‍යන්තර තරුණ දින සැමරුම් උත්සවය සඳහා අනුමත භාණ්ඩාගාර ප්‍රතිපාදනය රු. 5,000,000 ක් වුවත් එම සීමාව ඉක්මවා රු. 9,602,715 ක් වියදම් කර තිබූ අතර වෙනත් වැඩසටහන් දෙකකට වෙන්කළ ප්‍රතිපාදන ඒ සඳහා භාවිතා කර තිබුණි. | 2018 වාර්ෂික සැලැස්මේ ඇතුළත් කර තිබූ No Drugs අපි Youth වැඩ සටහන හා 2018 Youth with talent වැඩසටහන ජාත්‍යන්තර තරුණ දින වැඩසටහනට ඒකාබද්ධ කර ක්‍රියාත්මක කිරීමෙන් වියදම් අවම කරගැනීමට හැකිවී ඇත. No Drugs අපි Youth හා යොවුන් පාර්ලිමේන්තු වැඩසටහන මගින් අතිරේක මුදල් ලබාගෙන තිබුණි. | වැඩසටහන් සඳහා අනුමත කරනු ලබන ප්‍රතිපාදන සීමාව තුළ වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා අවධානය යොමු කළ යුතුය. |
| (ආ) 2018 වර්ෂයේ යොවුන්පුර වැඩසටහන සඳහා වූ ව්‍යාපෘති වාර්තාව අනුව ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 150 ක් වුවත්, ඒ සඳහා රු. 176,578,040 ක් වැය කිරීම හේතුවෙන් අනුමත සීමාව රු. 26,568,040 කින් ඉක්මවා තිබුණි. | යොවුන්පුර 2018 වැඩසටහන රු. මිලියන 150 ක් තුළ තරුණ තරුණියන් 7000 ක සහභාගීත්වයෙන් පැවැත්වීමට කටයුතු කලද අමතර කූඩාරම් 250 ක් බාහිර ආයතනවලින් ලබාගැනීමටද සනීපාරක්ෂක, ජලනල පහසුකම් වෙනුවෙන් විදුලිබල මණ්ඩලය හා ජලසම්පාදන හා ජලපවහන මණ්ඩලය වැනි රජයේ ආයතනවලට මිලියන ගණනින් මුදල් ගෙවීමට සිදුවීමත් යටිතල පහසුකම් වැඩිකිරීමටත් සහභාගිකයන්ට ටී ෂර්ට්, කැප් හා මග් වැනි තිළිණ ප්‍රදානය කිරීමටත් අමතර මුදලක් වැය දැරීමට සිදු විය. | අනුමත ඇස්තමේන්තු තුළ වියදම් දැරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනත අනුව තරුණ සංවිධාන පිහිටුවීම සහ තරුණ සුභ සාධනය සඳහා දැනටමත් පිහිටුවා ඇති සංවිධානවලට සහය වීමත්, තරුණ සංවිධාන පිහිටුවා ඒවා ලියාපදිංචි කරවීම, එම සංවිධානවලට උපදෙස් ලබාදීම, තාක්ෂණික දැනුම සැලැස්වීම හා මුදලින් ආධාර දීමත් දක්වා තිබුණද, ඊට පටහැනි ලෙස සමාලෝචිත වර්ෂයේ | සභාවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයට ආධාර ප්‍රදාන ලෙස රු. 3,050,000 ක් ලබාදී එම මුදලින් වැඩ අයිතම 9 ක් ඉටු කරගෙන ඇත.<br>යොවුන්පුරයට අදාල කාර්යය ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය විසින් ඉටු කිරීමට ඉල්ලා සිටින | සභාවේ පනතට සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව ක්‍රියා කළ යුතුය. |

| | |
|---|---|
| ජාත්‍යන්තර තරුණ දිනය සැමරීමේ වැඩසටහනට අදාල වැඩ අයිතමයන් 09 ක් ඉටු කරවාගැනීම සහ යොවුන්පුර වැඩසටහන සඳහා තේපැන් සංග්‍රහය වෙනුවෙන් ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය වෙත පිළිවෙලින් රු. 3,050,000 ක් හා රු. 3,219,500 ක් ලබා දී තිබුණි. | බවත් එය ඉතා වගකීමෙන් හා නිසි පරිදි ඉටු කල යුතු බැවින් ඒ පිළිබඳ අත්දැකීමක් ලබා ගැනීමට එම කාර්යය සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට අනුව ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයට පවරන ලදී. |
| තවද, මෙම කාර්යයන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය වෙත ලබාදී තිබූ අතර අදාල වියදම් පරීක්ෂා කිරීම සඳහා ඊට අදාල ලිපිගොනු 2018 දෙසැම්බර් 31 දින දක්වාම විගණනයට ඉදිරිපත් නොවුණි. | අදාළ ලිපිගොනු කඩිනමින් ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයට උපදෙස් දී ඇත. |

## 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිවිසුම්ගත වටිනාකම පිළිවෙලින් රු. 73,007,519 ක් හා රු. 68,903,239 ක් වූ ත්‍රිකුණාමලය ලව්ලේන් පුහුණු මධ්‍යස්ථානය හා දඹුල්ල ස්විස් පුහුණු මධ්‍යස්ථානය නවීකරණය හා වැඩිදියුණු කිරීමේ කර්මාන්තවලට අදාල ප්‍රගතිය පහත් මට්ටමක පැවතීම හේතුවෙන් 2018 වර්ෂයේදී කොන්ත්‍රාත් ගිවිසුම් අවලංගු කර තිබුණද 2019 ජූලි 31 දක්වා එම කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කිරීම සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එහි ඉතිරි වැඩ කොටස් නිමකිරීම සඳහා 2019 ජුනි 30 දින තෙක් වෙනත් කොන්ත්‍රාත්කරුවකු වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කර නොතිබුණි. | ව්‍යාපෘති 2 හිම ඉතිරි වැඩ නිම කිරීම සඳහා අවශ්‍ය සියළුම සැලසුම් හා ඉංජිනේරු ඇස්තමේන්තු උපදේශක ආයතනයෙන් ලබාදී ඇත. නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනෙන් 2019 සඳහා ලබාදී ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් අතිරේක ප්‍රතිපාදන ඉල්ලා ඇති අතර, අයවැයෙන් ජාතික තරුණ සේවා සභාවට ලැබෙන ප්‍රතිපාදනද පරීක්ෂා කර බලා ව්‍යාපෘති දෙක ක්‍රියාත්මක කරන බව දක්වා තිබුණි. අසාධු ලේඛනගත කිරීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරියේදී දැනුම්දෙනු ලැබේ. | ලැබී ඇති ප්‍රතිපාදන භාවිත කර ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීම කළ යුතු අතර ප්‍රමාදයන් වළක්වා පුහුණු මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් නියමිත පරිදි පැවැත්වීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ)බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනය නවීකරණය හා නව ඉදිකිරීම් කර්මාන්තයේ අදියර I සහ අදියර II පිළිවෙලින් 2018 නොවැම්බර් 02 හා 2019 මාර්තු 31 දින අවසන් කළ යුතු වුවත්, 2019 ජුනි 30 දින වන විට එහි ප්‍රගතිය පිළිවෙලින් සියයට 60 ක් හා සියයට 8 ක් වශයෙන් පහළ මට්ටමක පැවතුණි. | බෙල්වුඩ් අදියර I කොන්ත්‍රාත්තුව අවසන් කර නොමැති අතර කාර්යය ඉතාමත් මන්දගාමීව ඉටුකරමින් ඇත. ඉදිරිපත් වූ බිල් වලින් රු.1,395,210 ක ප්‍රමාද ගාස්තු අයකරගෙන ඇත. සතුටුදායක ප්‍රගතියක් නොමැති හෙයින් කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව වැඩබිම තහනම් කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී ගැනීමට නියමිතයි.<br><br>අදියර II කොන්ත්‍රාත්තුව ඉතාමත් මන්දගාමීව ඉටුවෙමින් පවතින අතර ඒ පිළිබඳව කොන්ත්‍රාත් ආයතනය දැනුවත් කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව අදාල කාර්යයන් ඉටු කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික තරුණ සේවා සභාවේ 2016 පෙබරවාරි 11 දිනැති අංක 02/2016 දරන චක්‍රලේඛයට අනුව රු. මිලියන 100 ත් 200 ත් අතර වටිනාකමක් ඇති කොන්ත්‍රාත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය යටතේ සිදු කළ යුතු වුවත්, බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනය නවීකරණය හා නව ඉදිකිරීම පිළිගත හැකි පදනමකින් තොරව අදියර I සහ අදියර II වශයෙන් පිළිවෙලින් රු. මිලියන 99.66 ක් හා රු. මිලියන 97.79 ක් වශයෙන් කොටස් දෙකකට ඛණ්ඩනය කර 2017 වර්ෂයේ අවස්ථා දෙකකදී දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය යටතේ එකම කොන්ත්‍රාත්කරුවකු වෙත ප්‍රදානය කර තිබුණි.<br>තවද අදියර II යටතේ වූ නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර අදියර I යටතේ වූ පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමේ කටයුතු අවසන් විය යුතු වේ. එසේ වුවද, අදියර I හි කොන්ත්‍රාත් කාලය අවසන් වීමට මාස 10 කට පෙර එනම් වැඩ ආරම්භ කිරීමට අවශ්‍ය මූලික අවශ්‍යතාවයන් ඉටු වී නොතිබියදී අදියර II සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර අත්තිකාරම් ලෙස රු. 22,491,900 ක් ගෙවා තිබුණි. | 2017 වර්ෂය ආරම්භයේ අනුමත ඉදිකිරීම් ක්‍රියාකාරී සැලැස්මේ මෙම ව්‍යාපෘතිය සඳහා සීමිත ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් වී තිබුණි. වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණයට ගැලපෙන ලෙස අදියර 1 වශයෙන් කොන්ත්‍රාත් ප්‍රදානය 2017 ජූලි සිදුකර ඇත.<br>2017 වර්ෂය අවසන් වන විට ක්‍රියාකාරී සැලැස්මට අදාල ව්‍යාපෘති 07ක් ඉටු නොවූ බැවින්, ලැබුණු ප්‍රතිපාදන උපරිම ප්‍රයෝජන ගැනීමේ අරමුණු ඇතිව, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ “රජයේ ප්‍රසම්පාදන කාර්යයන් වේගවත් කිරීම” පදනම් කොට ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර බෙල්වුඩ් අදියර 11 කොන්ත්‍රාත්තුව 2017 දෙසැම්බර් 30 දින ප්‍රදානය කර ඇත.<br>බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනය සංවර්ධනයට අදාල ඉදිකිරීම් නවීකරණ කටයුතු අදියර I කොන්ත්‍රාත්තුව 2017.08.03 දින ආරම්භ කර 2018.11.02 දින අවසන් විය යුතුය. අදියර II කොන්ත්‍රාත්තුව 2018.01.05 ආරම්භ කර 2019.04.25 වන විට අවසන් විය යුතුය. ඒ අනුව, අදියර I ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමේ කටයුතු 2017 සැප්තැම්බර් මස ආරම්භ කර ඇති අතර 2018 ජනවාරි මස අදියර II ට අදාල මූලික වැඩ ආරම්භ කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු අතර නියමිත කාලය තුළදී කොන්ත්‍රාත් නිමකරවා ගැනීමට නිසි අධීක්ෂණයකින් යුතුව කටයුතු කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ IV වන පරිච්ඡේදයේ 3.3 ඡේදය අනුව, අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව ස්ථිර නිලධාරීන් පත් කිරීමට පියවර ගත යුතු වුවද මාස 09 සිට වසර 04 කට අධික කාලයක සිට සහකාර තරුණ සේවා නිලධාරීන් 14 දෙනෙකු හා කළමනාකාර සහකාර (තාක්ෂණික නොවන) නිලධාරියෙකු අනියම් පදනම යටතේ පත් කර තිබුණි. ඉන් 11 දෙනෙකුට බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් මූලික සුදුසුකම් හෝ නොතිබුණි. | සභාවේ අවශ්‍යතාව මත 2014 වර්ෂයේදී අනියම් පදනමින් බඳවාගෙන ඇත. සුදුසුකම් සම්පූර්ණ කර නොමැති නිලධාරීන් සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා ඇති නමුත් උපදෙස් ලැබී නොමැති බැවින් ලැබෙන උපදෙස් අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | බඳවා ගැනීමේ පරිපාටියේ සුදුසුකම් අනුව නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.7 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දී ඇති “තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030” ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු අතර ජාතික තරුණ සේවා සභාව විසින් තම විෂය පථයට ගැනෙන තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොමැත. | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2017 අගෝස්තු 14 දිනැති අංක NP/SP/SDG/17 දරණ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |